ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීර්යයෙන් ජීවිතය ජයගන්නට
වෙර දරනා පින්වන්ත දූ පුතුන් උදෙසා...

ශ්‍රී බුද්ධ වර්ෂ 2561
ව්‍යවහාර වර්ෂ 2017
ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්



# මාපිය වන්දනා

පිටු අංක 28





කාලි යකින්නියගේ
කථා වස්තුව

පිටු අංක 12



සෙනෙහෙබර
ආමන්ත්‍රණය

පිටු අංක 20



නිර්මාණ ඉසව්ව

පිටු අංක 25



පුණ්‍යක්‍රියා

පිටු අංක 43



www.shraddha.lk



මහා කාරුඩික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සිය+ දෙශ්‍රී නිසුන් හට
ඝීමුක්තියේ මාර්ගය ඝීවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම ස■මා
ස■බුඥා රජාණන් වහන්සේට අපගේ නමස්කාරය ශ්‍රේවා ඊ



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද මිනිස් ජීවිතය
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ.
ව්‍යවහාරික වර්ෂ 2017ක් වූ දෙසැම්බර් මස 03 වැනි දින දී ය.

නමෝ බුද්ධාය !!!

දයාබර දුවේ පුතේ,

දොරටුවක් කියද්දී අපට මතක් වන්නේ දෙපසක් යා කරන තැනක් නේද? කවර හෝ තැනකට ඇතුළු වෙන්නත්, කවර හෝ තැනකින් පිට වෙන්නත් තමයි දොරටු භාවිත වෙන්නේ. මේ මිනිස් ජීවිතය තුළ අප නොයෙක් දොරටු තුළින් බොහෝ වතාවන්වල ගමන් කර තිබෙනවා. දවස ගානේ ම අපි හැමෝම නොයෙක් තැන්වලට පිවිසෙන්නත්, පිට වන්නත් දොරටු භාවිත කරනවා.

දුවේ පුතේ, අපි සාමාන්‍යයෙන් දොරටුවක් කියා හඳුනාගෙන භාවිත කරන තැනකින් ඇතුළු වීම්, පිටවීම් මොන තරම් සිදු කළත් ඒ හැම එකක් ම අපේ ජීවිතවල තීරණාත්මක සාධකයක් වන්නේ නැහැ. හැබැයි, මේ ජීවිතය තුළ වගේ ම සසර ගමන තුළත්, සසර ගමනේ නිමාව තුළත් අතිශය තීරණාත්මක බවට පත්වන දොරටු කිහිපයක් අපේ ජීවිතවල තිබෙනවා. අප සරණ ගිය ශාස්තෲන් වහන්සේ දේශනා කොට වදාළේ ඒ අප විසින් සංවර කර ගත යුතු දොරටු කියල යි. 'තුන්දොර' කියා අප අසා තිබෙන සිත, කය සහ වචනය තමයි දුවේ පුතේ සංවර කර ගත යුතු යැයි සම්බුදුරජුන් වදහළ, අපේ ජීවිතවල තීරණාත්මක දොරටු වන්නේ.

සීලය, පින, කුසලය, යහපත දියුණු කරන්නට උපකාර නොලැබෙන ලෝකයක දී බොහෝ දෙනා කය වරදවාගෙන දුගතියේ යනවා. වචනය වරදවාගෙනත් දුගතියේ යනවා. කය යි, වචනය

යි වරදවා ගත්තා කියන්නේ එයට පෙරටුවෙන් සිටින සිත වරදවා ගැනීම ම තමයි සිද්ධ වෙලා තියෙන්නේ. ඉතින් යම් කෙනෙක් මේ ආකාරයෙන් සිත, කය, වචනය වරද්දා ගත්තොත් ඒ අයට ඇරෙන්නේ සතර අපායේ දොර. කවුරු හරි කෙනෙක් සිත, කය, වචනය සංවර කර ගත්තොත් ඒ අයට ඇරෙන්නේ සුගතියේ දොර. ඒ වගේ ම යි යම් කෙනෙක් මනා කොට මේ දොරටු සංවර කර ගත්තොත්; ඒ කිච්චේ අකුසලයක්, වැරැද්දක්, පවක් සිදු වන්නට නො දී පරිස්සම් කර ගත්තොත් ඒ කෙනා මේ ධර්ම මාර්ගය දියුණු කරන කෙනෙක් වෙනවා. දුවේ පුතේ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් සරණ යන්නට වාසනාව ලබපු අප උත්සාහවත් විය යුත්තේත් ඒ වෙනුවෙන්. අප සරණ ගිය ශාස්තෘන් වහන්සේ සිත, කය, වචනය සංවර කළා. මැනැවින් පිරිසිදු කළා. ඒ නිසා ම උන්වහන්සේගේ ජීවිතය අතිශයින් පාරිශුද්ධ භාවයට පත් වුවා. දෙවිමිනිස් ලෝකයේ සියලු පුද පූජාවන් පිළිගැනීමට සුදුසු උත්තම භාවයට පත් වුණා. එසේ පරම පිරිසිදු භාවයට පත් වූ උන්වහන්සේ මහා අනුකම්පාවෙන් යුතුව අපට අවවාද කොට වදාළේත් අප සිතන, කරන, කියන සෑම දෙයක ම ප්‍රතිඵලය එය සිදු කරන්නට පෙරත්, සිදු කරද්දීත් විමසා බලන්න කියලයි. ඒ කරන කියන සිතන දේවල් අපටත්, අන්‍යයන්ටත් යන දෙපිරිසිට ම යහපත, හිතසුව පිණිස පවතිනවා නම් පමණක් ම ඒ දේ පවත්වන්න කියාත් අපේ ශාස්තෘන් වහන්සේ අවවාද කොට තිබෙනවා.

සංවරය, හික්මීම ගැන කියා දෙන, එයට මග පෙන්වන, එය ම ප්‍රශංසා කරවන ධර්මයන් ලෝකයේ සුලබ නැහැ. බොහොම කලාතුරකින් තමයි ලෝකයේ එවැනි මාර්ගෝපදේශනයක් මුණ ගැසෙන්නේ. සුගතියත්, දුගතියත් අතර ගමනක දෙපසට අප ගෙන යන මෙවන් දොරටු ගැන මෙතරම් පරිපූර්ණ, මෙතරම් පැහැදිලි විස්තර කිරීම් දක්නට ලැබෙන්නේ සම්බුද්ධ ශාසනය තුළ ම පමණයි.

දුවේ පුතේ, ඔබට එය අසන්නට දකින්නට ලැබෙන්නේ ජීවිතයේ මුල් ම අවධියක. ඔබ බොහෝ සෙයින් වාසනාවන්තයි. ඔබට හැකියි ඔබ හැදෙන ගසක් බව පෙන්වන්නට; ඒ වගේ ම මැනැවින් ම හැදී වැඩෙන්නට. සිතේ තිර අදිටනක් ඇතිකර ගන්න, 'අප ගුණධර්මයන් උපදවා ගන්නවා, උපදවා ගත් ගුණධර්මයන් රැක ගන්නවා' කියා. ඒ තුළ ම පිහිටා වැඩෙන්නට ඔබට හැකි වුණොත්, ඒ තිදොර සංවරයේ ඒකාන්ත ප්‍රතිලාභය වන සුගතියත්, දහම් මග අභිවෘද්ධියත් ලබාගෙන ජීවිත තුළ අතිශය සැපවත් භාවයන් උපදවා ගන්නට ඔබ වාසනාවන්ත වනවා.

සංවරය පිණිස මග කියන ධර්මය දියුණු කරමින් සතර අපා දොරටු වසා සුගතියත්, නිවනත් වෙත යන දොරටු විවර කර ගන්නට ඔබට උතුම් තෙරුවනේ ආශීර්වාදය වේවා!!!
තෙරුවන් සරණයි!

මෙයට,
ගෞතම බුදුසසුන තුළ
මෙත් සිතින්,
අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ.
ශ්‍රද්ධා රූපවාහිනිය - ගුවන්විදුලිය.

# පටුන


01. කාලි යකින්නියගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 20

03. නිර්මාණ ඉසව්ව 25

04. මාපිය වන්දනා 28


05. පුණ්‍යක්‍රියා 43

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

(යමක වර්ගය)

පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන් වහන්සේ



වෛර නොකිරීමෙන් ම වෛරය සංසිඳේ...

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස
**ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!**

# කාලි යකින්නියගේ කථා වස්තුව

## "වෛරයෙන් වෛරය නොසංසිඳේ. අවෛරයෙන් වෛරය සංසිඳේ."

ඒ දිනවල අපගේ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩසිටියේ. ඒ සැවැත් නුවර ම බොහෝම සතුටින් තරුණ මව්පිය දෙපළක් ජීවත් වුණා. ඔවුන්ට ලස්සන දරු සිඟිත්තෙක් ලැබුණා. දවසක් මේ තරුණ අම්මාට පුදුම සහගත දෙයක් දකින්ට ලැබුණා. ගෙයි තොටිල්ලේ නිදා සිටි දරුවා අසල කවුදෝ කෙනෙක් සිටගෙන සිටියා. කළුම කළුයි. ලොකු ඇස් දෙකක් තිබුණා. දළ දෙකක් එළියට ඇවිදින් තිබුණා. ඒ වේලාවේ අම්මා බය වුණා. දරුවාට අනතුරක් වෙයි කියලා කෑ ගහගෙන ගෙට දුවගෙන ආවා. එතකොටයි පැහැදිලිව දැක්කේ. ඒ යක්ෂණියක්. ඒ යකින්නි හයියෙන් හිනා වෙලා නොපෙනී ගියා. ළඟට ගිහින් බලන විට දරුවා මැරිලා හිටියා. ඒ යකින්නි දරුවාගේ ලේ බීලා!

ඒ අම්මයි තාත්තයි හොඳටම ඇඬුවා. ඒ මව්පියන්ට ආයෙමත් දරු සිඟිත්තෙක් ලැබුණා. අර යක්ෂණී කොහෙන් හරි මතුවෙලා එනවා. ඒ දරු සිඟිත්තාත් මේ පව්කාර යක්ෂණී බිලිගත්තා. ඒ වතාවෙත් අම්මයි තාත්තයි හොඳටම ඇඬුවා. ආයෙමත් ඒ මව්පියන්ට ලස්සන දරු සිඟිත්තෙක් ලැබුණා. අම්මයි, තාත්තයි හරිම බයෙන් ඉන්නේ. මෙයාලට හිතාග න්න බැහැ මේ සිදුවෙන්නේ මොකක්ද කියලා. මැණිකක් වගේ ආදරයෙන් දරුවා ආරක්ෂා කරගෙන සිටියා.

දවසක් මේ අම්මා නාන තොටුපළට දරුවා රැගෙන ගියා. දරුවා නාවලා ඉවුරෙන් තියලා අම්මා නාන්න පටන් ගත්තා. ඈතින් කළුපාට තිතක් වගේ දෙයක් එන හැටි එකවරම අම්මාට දකින්නට ලැබුණා. අම්මාට කාරණය වැටහුණා.

"අනේ !... මගේ බුදු සමිඳුනේ!.. අන්න යක්ෂණී මගේ දරුවා ඩැහැගන්න එනවා."

අම්මා විදුලියක් වගේ දුවගෙන ඇවිදින් දරුවා තුරුලු කරගත්තා. එක හුස්මට පාර දිගේ දුවන්න පටන් ගත්තා. මිනිසුන් පුදුමයෙන් වගේ බලා සිටිනවා. අම්මා කෑ ගසමින් පාර දිගේ දුවනවා. "අනේ... මගේ දරුවා බේරාගන්න" කියලා. ටිකෙන් ටික යක්ෂණිය අම්මා ළඟට එනවා. අම්මා කෙලින්ම දිව්වේ ජේතවනාරාමයට යි.

ඒ අම්මාගේ වාසනාව. දරුවාගෙත් වාසනාව, බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි වැඩ සිටියා. අම්මා විලාප තියාගෙන දුවගෙන ඇවිදින් බුදුජාණන් වහන්සේ ඉදිරියේ දරුවා තිබ්බා. "අනේ... මගේ බුදුරජාණන් වහන්ස, මේ දරුවා ඔබ වහන්සේට බාරයි. මේ දරුවා ආරක්ෂා කරදෙන සේක්වා! අනේ මගේ බුදුරජාණන් වහන්ස, යක්ෂණියක් ඇවිදින් කලින් දරුවන් දෙදෙනා ම කාලා දැම්මා. මේ දරුවා බිල්ලට ගන්න ආයෙමත් ආවා...."

යක්ෂණිය ජේතවනාරාමයට ඇතුළු වුණේ නැහැ. දොරටුව ළඟ නැවතී සිටියා. බුදුරජාණන් වහන්සේ යක්ෂණියට කතා කළා. ළඟට එන්න කිව්වා. යක්ෂණිය බයෙන් බයෙන්, බොහෝ තැති අරගෙන, කරබාගෙන බුදුරජාණන් වහන්සේ ඉදිරියට ආවා. ඇවිදින් පැත්තකින් වාඩි වුණා.

"එම්බා යක්ෂණී, දැන් නුඹ මා මේ කියන ගාථාව හොඳින් අසාගෙන ඉන්න ඕන. අර්ථය සිහි කරන්න ඕන. ඔය පව්කාර

ජීවිතෙන් නිදහස් වීමට එතකොට නුඹට පුළුවන් වේවි. මේ ළමයි මරාගෙන කන එක දැන්වත් නවත්වා දමාපන්. මේ වෛරය දිගින් දිගට ගෙනියන්න එපා. මේ ගාථාව හොඳින් තේරුම් ගනින්."

**න හි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං**
**අවේරේන ච සම්මන්ති - ඒස ධම්මෝ සනන්තනෝ**

**වෛර කිරීමෙන් කිසිදා**
**- නැත වෛරය නැති වන්නේ**
**වෛර නොකර සිටීමෙන්ම**
**- වෛරය නැති වී යන්නේ**
**වෛර නොකර සිටිනා විට**
**- වෛරය සංසිඳී යෑම**
**සැමදා මේ ලොව පවතින**
**- දහමක් ලෙස දත යුතුමය**

යක්ෂණිය අඬන්න පටන් ගත්තා. බුදුරජාණන් වහන්සේට වන්දනා කළා. රැස්වුණ පිරිසට මේ ගැන මහා කුතුහලයක් ඇති වුණා. මේ ප්‍රශ්නය කුමක්ද කියා කාටවත් තේරුණේ නැහැ. ඈත අතීතයේ මිනිස් ලෝකයේ සිදු වූ දෙයක් භව ගණනක් තිස්සේ පළිගැනීම්වලට ගොදුරු වන ආකාරය ගැන බුදුරජාණන් වහන්සේ කියා දුන්නා.

මේක අද ඊයේ සිදුවූ දෙයක් නොවෙයි. එක්තරා කාලෙක මේ යක්ෂණිය යි, මේ අම්ම යි එකම පවුලේ බිරින්දෑවරුන් දෙදෙනෙක් වෙලා සිටියා. වෙන කොහේවත් නොවෙයි. මේ සැවැත් නුවර ම යි. ඒක මෙහෙමයි වුණේ.

ධනවත් කෙනෙක් එක්තරා කාන්තාවක් සමඟ විවාහ වුණා. නමුත් ඒ කාන්තාවට දරුවන් ලැබුණේ නෑ. ඔහුගේ පවුලේ මව්පියන් ඒ ගැන කනගාටු වුණා. දරු සම්පත් නැති වුණොත්

පරම්පරාව විනාශ වෙනවා කියලා රණ්ඩුදබර කළා. අන්තිමේ දී තවත් කාන්තාවක් ගෙදරට කැන්දන් ආවා. ඒ කාන්තාවට බොහෝ සැළකිලි ලැබුණා. කලින් විවාහ වුණු කාන්තාව මැයට ඊර්ෂ්‍යා කළා.

“නංගියේ... මට නම් දරු සම්පත් ලබන්න වාසනාවක් නැහැ තමයි. නමුත් ඔයාට දරු සම්පතක් ලැබෙන්න හිටියොත් මට කියන්න. මං ඔයාට උදව් කරන්නම්....”

ටික කලකින් දෙවැනි කාන්තාවට දරු සම්පතක් පිහිටියා. ඇයට හරි සතුටුයි. ඇය හැමෝටම කිව්වා. පළමු කාන්තාවටත් කිව්වා. එතකොට ඒ පළමු කාන්තාවගේ ඇස් රතු වුණා. මූණ පළල් වුණා. ඊර්ෂ්‍යාව ඇති වුණා. හොර රහසේම මව් කුසේම දරුවා මැරෙන බෙහෙත් දුන්නා. දරුවා මැරුණා. අම්මා යාන්තමින් බේරුණා. කාටවත් මේ කරුණ සොයාගන්න බැරි වුණා.

ඒ දෙවැනි කාන්තාවට ආයෙත් දරු සම්පතක් පිහිටියා. ඇය ආයෙමත් සතුටු වුණා. හැමෝටම කිව්වා. ඒ වතාවෙදිත් අර කලින් කාන්තාව මව්කුසේ සිටින දරු සම්පත වැනසෙන්න හොර රහසේ ම බෙහෙත් දුන්නා. ඒ දරුවත් මැරුවා. ඒ වතාවෙදි ගෙදර සියලු දෙනාම පළමු කාන්තාව සැක කළා. රණ්ඩු දබර ඇති වුණා. කලක් ගත වෙන කොට දෙවැනි කාන්තාවට ආයෙමත් දරු සම්පතක් පිහිටියා. මේ වතාවේ ඇය කාටවත් කිව්වේ නැහැ. ඉතා පරිස්සමින් දරු සම්පත රැකගන්න මහන්සි ගත්තා.

මව්කුසේ දරුවා වැඩෙද්දී ඒ අම්මාගේ කුස ඉදිරියට නෙරා ආවා. එතකොට අර නපුරු ස්ත්‍රිය මේ රහස දැනගත්තා. ඇයට ආයෙමත් දරුවා මරණකල් ඉවසුමක් නැහැ. ඇය හොර රහසේම දරුවා මැරෙන්න බෙහෙත් දුන්නා. මව්කුසේම දරුවා මැරුණා. නමුත් ඒ දරුවා මව්කුස තුළ වැඩුණු දරුවෙක් නිසා අම්මත්

මරණාසන්න වුණා. ඒ අම්මාට ඇති වුණ දුක, වේදනාව, කම්පනය නිම්හිම් නැහැ. ඇය ද්වේෂයෙන් දෑස් ලොකු කරගත්තා. හඬා වැළපෙන්න පටන් ගත්තා. කෑගසන්න පටන් ගත්තා. ඇය දත්මිටි සපමින් මෙහෙම කිව්වා.

"ඒයි... සැතිරියේ... තී දැනගනින්. මගේ කලින් දරුවන් දෙදෙනාම මව්කුසේම මරල දැම්මේ තී තමයි. මේ වතාවෙදිත් දරුවයි, මායි දෙන්නම මරාගත්තා. ඒයි සැතිරියේ... මං ජාති ජාතිත් තිගෙන් පළිගන්නවා. මං තිගේ දරුවනුත් මරනවා, මරනවාමයි. තීත් මරනවාමයි" කිය කියා ඇයත් මරණයට පත් වුණා.

ඉන්පසු ඔවුන් සත්තු වෙලා ඉපදුනා. එකිනෙකාගේ දරුවන් මරාගෙන කෑවා. මේ වතාවේදීත් අර අම්මා වුණු කෙනා ඉපදුණේ යක්ෂණියක් වෙලයි. දරුවන් වැනසෙන්න බෙහෙත් දීපු කෙනා ඉපදුණේ මිනිස් දුවක් වෙලයි. මේ වතාවේදිත් අර යක්ෂණිය දරුවන් දෙදෙනෙක්ම මරා දැම්මා. තුන්වෙනි දරුසිඟිත්තා මරන්න සූදානම් වෙද්දී තමයි මේ අම්මා ජේතවනාරාමයට දුවගෙන ආවේ.

බුදුරජාණන් වහන්සේ අතීත ජීවිත කථාව විස්තර කරද්දී යක්ෂණිය හඬා වැළපුණා. අර අම්මත් හඬා වැළපුණා. සිතක හටගන්නා වෛරය මොනතරම් දුරක් යනවද! භවයක් භවයක් ගානේ පස්සෙන් එන්නේ සසර පුරුද්දක් හැටියට වගෙයි. වෛරය මේ තරම්ම භයානකද? මිනිස් ලොව, තිරිසන් ලොව, ප්‍රේත ලොව ආදී කොයි ලෝකෙදි වුණත්, වෛරය පිහිටුවාගෙන සිටින ආකාරය අනුව එකිනෙකා මුණගැහෙනවා. පළිගන්නවා. වධ වේදනා විඳිනවා. අවසන් වීමක් නැහැ. එහෙම නම් පින්වතුනේ, පින්වත් දරුවනේ, වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නෑ කියන කරුණ සනාතන ධර්මයක්. ඒ වගේම වෛර නොකිරීමෙන් වෛරය

සංසිඳීමත් සනාතන ධර්මයක්. ඒ වගේම වෛර නොකිරීම ම යි උතුම්. එනිසා ම යි සංසිඳීම ඇති වන්නේ.

වෛරයක් ඇති වුණොත් කරන්න තිබෙන හොඳම දෙය තමයි මෙත් සිත පැතිරවීම. ඒ මෛත්‍රී සිත නිසාත් වෛරය දුරුවෙලා යනවා.

ඇතැම් වෙලාවට මෙත් සිත පතුරුවන්න මහන්සි ගත්තත් වෛර සිත ම මතුවෙන්න පුළුවනි. එතකොට කරන්නේ ඒ පුද්ගලයා කෙරෙහි කරුණාවන්තකම ඇති කර ගැනීම යි. කරුණාව දියුණු කරගත්තොත් ඒ අනුකම්පාව නිසාම වෛරය නැති වෙනවා.

කරුණාව ඇති කරගන්නට මහන්සි ගනිද්දිත් නැවත නැවතත් වෛර ඇතිවෙන කරුණම මතු වෙවී එන්න පුළුවනි. එතකොට කරන්න තියෙන්නේ ඒ තැනැත්තා කෙරෙහි උපේක්ෂාවෙන් බැලීම යි. ඒ කියන්නේ අපට මෙයා ගැනම සිත සිතා ඉඳලා වැඩක් නැහැ. අපේ වැඩක් බලාගන්න එකයි හොඳ කියලා හිත මධ්‍යස්ථ කරගන්න ඕන. එතකොටත් වෛරය නැති වෙනවා.

ඇතැම් අවස්ථාවල දී එහෙම කරලත් වෛරය දුරු වෙන්නේ නැහැ. එතකොට කළ යුත්තේ ඒ වෛරය ඇතිවන කරුණ මෙනෙහි නොකර සිටීමයි. වෙන දෙයක් සිහි කිරීමයි. ඒ වෛරය ඇති වෙන පුද්ගලයා ගැන නොසිතා වෙන දෙයක්ම දිගින් දිගටම සිහි කිරීමෙන් වෛරය නැතිවෙලා යනවා.

ඇතැම් විට, මේ වෛරය නොසංසිඳී තියෙන්න පුළුවනි. එතකොට ඔහු ගැන මෙහෙමයි සිතන්න ඕන. 'කවුරුත්, තමන්ගේ දේ හැටියට උරුම කරගන්නේ තම තමා හිතාමතා කරන දේවල් නෙව. ඒකෙන් මෙයත් නිදහස් වෙලා නැහැනෙ. මේ පුද්ගලයාට

තියෙන්නෙත් කර්මයම උරුම කරගත්තු ජීවිතයක්. කර්මය ම යි උප්පත්ති ස්ථානය කරගෙන තියෙන්නෙ. කර්මය ම යි දායාදය කරගෙන තියෙන්නෙ. හොඳ කර්මයක් කළොත් හොඳ විපාක ලැබේවි. නරකක් කළොත් නරක විපාක ලැබේවි. එයාට දායාදය වෙන්නෙත් එච්චර ම යි' කියලා ඒ උපන් වෛරය දුරින්ම දුරුකර දමන්න ඕන. වෛරය නිසා දුකින් දුකට පත්වෙන ආකාරය නුවණින් මෙනෙහි කරන්න ඕන. වෛරයෙහි ඇති භයානක විපාක ගැන බිය උපදවා ගන්න ඕන. වෛරය අත්හැර දමා සැනසීම ලබන ආකාරය ගැන සිතා සතුට ඇති කරගන්න ඕන. එතකොට ආහාර නොලැබෙන භයානක සතෙක් මිය යනවා වගේ වෛරය සිතෙන් ඉවත් වෙලා යාවි.



# සෙනෙහෙබර ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කර ගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය !*

*ආදරණීය රෂිනි දුව,*
*ඔබ මා අමතා ඇත්තේ අම්මේ තාත්තේ නමින් වුව ද මම තවමත් දෙමව්පිය සෙවණේ රැඳී සිටින ඔයා වගේම දුවක්. වෙනසකට ඇත්තේ මම රජයේ රැකියාවක් කිරීම යි. ඔබේ පළමු ලිපි දෙක මා හට ලැබුණේ මා සැත්කමක් සඳහා රෝහල් ගතවී සිටියදී. මගේ මව්පියන් එය මට රෝහලට ගෙනත් දුන්නා. ඔබේ ආශිර්වාදයෙන් මට ලැබුණා යැයි මම සිතනවා. මේ පිනෙන්ම මට ඉක්මන් සුවය ලැබේවා කියා මම සිතුවා. දැන් මට සම්පූර්ණයෙන්ම සුවයි.*

*ඔබේ ලිපි කියවා මා ඉමහත් සතුටක් ලැබුවා. මා ධාර්මිකව උපයන වැටුපෙන් කොටසක් වැය කර ඔබ වැනි ඉගෙනීමට දක්ෂ දරුවෙකුට උදව් කිරීමට ලැබීම ගැන ඉතා සතුටු වෙනවා. මෙම මහත්වූ පුණ්‍යකර්මය කර ගැනීමට මග පාද දුන් පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු මහමෙව්නාව භාවනා අසපු සංඝිතයේ පින්වත් ස්වාමීන් වහන්සේලා හා ශ්‍රද්ධා කාර්ය මණ්ඩලය වෙත මම නිරන්තරයෙන් පුණ්‍යානුමෝදනා කරනවා.*

*මා හට කෘතගුණ සැලකීමට ඔබට ඇති හොඳම ක්‍රමය වන්නේ හොඳින් ඉගෙන ගැනීමයි. එමෙන්ම උතුම් තුනුරුවන පිළිබඳ බලවත් ශ්‍රද්ධාවක් ඇති කරගන්න. රටටත් තම පවුලටත් වැඩදායක දියණියක් වන්නට අධිෂ්ඨාන ඇති කරගන්න. දැනුමෙන් මෙන්ම යහපත් ගුණධර්මවලින් පිරිපුන් හොඳ දරුවෙක් වන්න.*

*ඒ සඳහා මහමෙව්නාව ඔබට නිරන්තරයෙන් මග පෙන්වනු ඇත. එම අවවාද අනුශාසනා පිළිපදින්නේ නම් ඔබේ ජීවිතය සාර්ථක වනු නොඅනුමාන යි.*

*ඒ වගේම ඉංග්‍රීසි භාෂාවත් හොඳින් ඉගෙන ගන්න. අපේ රටේ විශාල දරුවන් පිරිසක් ඉංග්‍රීසි දැනුම සඳහා ඇති උනන්දුව මඳකම නිසා අතිශය අපහසුතාවට පත් වෙලා තිබෙනවා. කුඩා කුඩා ඉංග්‍රීසි පොත් කියවන්න. ළඟ දැනුමැති කෙනෙක් ඇත්නම් අසා දැනගන්න.*

*හොඳින් ඉගෙන ගෙන ජීවිතය ජය ගැනීම සඳහා අවශ්‍ය සියලු ශක්තිය හා ධෛර්ය ඔබ හට ලැබේවා කියා මම මුළු හදවතින්ම ප්‍රාර්ථනා කරනවා. හැකි වෙලාවක නැවත ලිපියක් ලියන්නම්. ඔයාටත් පවුලේ සැමටත් තෙරුවන් සරණයි.*

*මෙයට,*
*ඔබේ ආදර,*
*කැපකරු අම්මා.*

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහනක්...

*නමෝ බුද්ධාය !*

*ආදරණීය කැපකරු දෙමව්පියනි,*
*ඔබලාගේ සැපදුක් කෙසේද? පළමුව ලැබුවා වූ නව වසර ඔබ සැමට නිදුක් නිරෝගී අමා දම් අවබෝධය ළංවන වාසනාවන්ත සුබ නව වසරක් වේවායි මම ප්‍රාර්ථනා කරමි.*

*පුත්තාමත්ථි ධනම්මත්ථි - ඉති බාලෝ විහඤ්ඤති*
*අත්තාහි අත්තනෝ නත්ථි - කුතෝ පුත්තා කුතෝධනං*

*මෙහි මා සඳහන් කළේ ධම්මපදයෙහි බාල වග්ගයෙහි ගාථාවකි. මෙහි අර්ථය නම් අනුවණ තැනැත්තා " මට පුතුන් ඇත. මට ධනය ඇතැයි කියා සිතමින් පුත්‍ර තෘෂ්ණාවෙන් හා ධන තෘෂ්ණාවෙන් වෙහෙසෙයි. තමාට තමාත් නැතිනම් දරුවන් හෝ ධනය කොයින්ද? තණ්හාව කෙමෙන් දුරුකරන්නා නිවන කරා ළං වෙයි. එසේ නම් කැපකරු දෙමව්පියනි, නිර්වාණ සුවය ප්‍රාර්ථනා කරන බෞද්ධයන් ලෙස ශ්‍රද්ධාවෙන් හා සම්මා දිට්ඨියෙන් යුතුව සමාධිගතව සිත දියුණු කර ගැනීම මහත් කුසල කර්මයකි. ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ මෙම පුණ්‍ය ව්‍යාපෘතියේ එක් ශිෂ්‍යත්වලාභියෙකු බවට පත් වූයේ මා පෙර ආත්මභාවයක කළ කර්මයක ආනිශංස වශයෙනි.*
*මම මෙවර පාසල් වාර විභාගයෙන් පන්තියේ පළමුවැනියා. එලෙසම මම මෑතක දී මෙනේරිපිටියේ පැවැත්වූ ජාතික එලදායිතා තරගාවලියේ දැනුම මිනුම තරගයට ද ඉදිරිපත් වී ඇඹිලිපිටියේ අන්තර්ජාතික තරගාවලියට ඉදිරිපත් වීමට සුදුසුකම්*

ලැබුවෙමි. එමෙන්ම කොට්ඨාස ඉංග්‍රීසි භාෂා දින තරගාවලියේ ද අත් අකුරු ඉසව්වෙන් ප්‍රථම ස්ථානයට පත් වුණෙමි.

දයාබර කැපකරු මාපියන් මගේ අධ්‍යාපනික දියුණුව උදෙසා වෙහෙසව උපයා ශ්‍රද්ධාවෙන් පරිත්‍යාග කරන ඒ ශිෂ්‍යාධාරය මම වියදම් කළ අයුරු මෙසේයි.

උම්මග්ග ජාතකය පොත මිලදී ගැනීමට රු. 138කුත්, ගණිතය පන්තිය සඳහා රු.500කුත්, ගණිතයට අත්වැලක් පොත සඳහා රු.237කුත්, අච්චිට බසයේ යාමට අවශ්‍ය වූ අවස්ථාවේ රු.50කුත් ලෙසිනි.

කාලය ගලා යන්නේ කිසිදා නොනවතින ජල දහරක් ලෙසිනි. අත්තම්මා සහ සීයා ළඟ වැඩෙමින් අධ්‍යාපනය ලබා ගැනීමට උත්සහ කරන මට සැබැවින්ම මෙම ශිෂ්‍යාධාරය ආශිර්වාදය කැ යි මම සලකමි. මෙවර මගේ විභාග සාමාන්‍ය 92.46කි. ගම්බද පාසලක අධ්‍යාපනය ලබන මම තරගයකට වඩා දැනුම් පිපාසය සංසිඳුවා ගැනීමට නිතර කැපවෙමි. එළඹෙන වාර විභාගයේ මගේ සාමාන්‍ය පෙර විභාගයේ සාමාන්‍යට වඩා ඉහළට ගෙනයෑමට මම දැන් සිටම සූදානම් වෙමි.
මාගේ කැපකරු මාපියන්ට තෙරුවන් සරණයි !

මෙයට ආදරණීය දියණිය,
සසාදී කුමාරි.

# නිර්මාණ ඉසව්ව

පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව



සමාධි අනුරුද්ධිකා දියණිය විසින් එවූ සිතුවමක්...



දුලංජලී අබේරත්න දියණිය විසින් එවූ සිතුවමක්...

ඔබ කැමති මාතෘකාවකින් කවි, නිසඳැස්, කෙටිකතා, චිත්‍ර ආදී ඕනෑම නිර්මාණයක් ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව අංශය වෙත යොමු කරන්න.

ශ්‍රද්ධා සමාජ සත්කාර අංශය,
නො. 369, හේවාගම, කඩුවෙල.
www.shraddha.lk
edu@shraddha.lk




වින්සරා සඳමාලි දියණිය විසින් එවූ සිතුවමක්...

එළඹෙන වර්ෂයේ
ඇත තරණය කරන්නට තියුණු පවුරක්
අඟ හිඟය මිල මුදල්
නමුත් හිත එඩිතරය
බුද්ධිය ද පොහොසත්ය

නොයොදවමි මිල මුදල්
නිකරුණේ නාස්තියේ
ඵල ඇති යමක් එයින්
කරන්නෙමි හැම කල්හි

සරසවි සිහිනය දකින්නෙහිමි හැමදම
නමුත් එය සැබෑවක් කරන්නට වෙර දරමි
ඒ උතුම් සිහිනයේ හිමිකරුය ඔබ සැවොම
ඔබෙන් ලද අත්වැලට
මා සදා ණයගැතිය

නොපතමි කිසිදක
දැනෙන්නට පුංචි හෝ දුකක්
පතන්නෙමි මෙම භවයේ
අසන්නට ලැබේවා උතුම් ශ්‍රී සද්ධර්මයම

නදීෂා ලක්මාලි දියණිය විසින් එවූ නිර්මාණයක්...



චානුක සංදීප් පුතණුවන් විසින් එවූ සිතුවමක්...




දුලක්ෂි කාවින්ද්‍යා දියණිය විසින් එවූ සිතුවමක්...



අමීෂා සෙව්මිණී දියණිය විසින් එවූ සිතුවමක්...



විශ්වජිත් මිහිදුම්පිටිය පුතණුවන් විසින් එවූ සිතුවමක්...



චමිලා අචලානි දියණිය විසින් එවූ සිතුවමක්...

බුදු පුද පා නමදින්නට
පිං මද ඇත ඒ කතරේ
සහෘද දන පිං මහිමෙන්
පරසතු සර විඳිමින්නේ

සසර සරණ නොයෙක් දනන්
පිං දරමින් මතුමත්තේ
වියරුණු ගත නොසලකාම
පිං දහරා සරසන්නේ

බුදු පාමොක් ලද පිංසර
මතු මත්තේ සවණක් රැස්
දකිනට රන් රැස් මාලා
මව්නි, පියනි ඔබ පිං ලත්තේ

සකුන්තලා දියණිය විසින් එවූ නිර්මාණයක්...



# මාපිය වන්දනා

ආදරණීය දුවේ පුතේ,

උපදින්න බොහෝ තැන් තිබිය දී ම යි අපට පින තිබුණේ මනුස්ස ලෝකයට එන්න. පෙර ජීවිතයේ හිටපු කවර හෝ තැනක දී අපේ මරණය සිදු වුණා. ඒ මැරුණු මොහොතෙ ම අපි අපේ අම්මාගේ කුසේ පිළිසිඳ ගත්තා. මේ මනුස්ස ලෝකයේ උපදින්න ඒ ආකාරයෙන් පිළිසිඳ ගැනීම සිදු වෙනවාත් එක්ක ම මේ ජීවිතයේ අපට අම්මාත්, තාත්තාත් හිමි වුණා. ලෝකයේ වෙන කිසි ම කෙනෙකුට ඒ ඥාතීත්වයට උරුමකම් කියන්නට බැහැ. ඒ තැනට ආ හැකි දෙවැන්නෙක් ලෝකයේ කොහේවත් නෑ. අපට මිනිස් ලෝකයේ උපත තහවුරු කරපු ඒ අම්මටයි, තාත්තටයි සම වන කෙනෙක් මේ ජීවිතයේ මුණගැහෙන්නේ නැහැ.

## නොදැක ම උපන් සෙනෙහසක අරුමය

දරු සම්පතක් තමන්ටත් හිමි බව දැනගත්ත දවසේ පටන් අප මෙලොව එළිය දකිනකල් අම්මගෙත්, තාත්තගෙත් හිතේ මොන තරම් බලාපොරොත්තු ගොඩනැගෙන්නට ඇති ද? තමන්ට දරුවෙක් ලැබෙන්න සිටිනවා කියලා විතරයි ඔවුන් මුලින් දැන ගන්නේ. ඒ දුවක් ද පුතෙක් ද ඇස, කන, නාසය, දිව, කය, මනස හොඳින් පිහිටලා තියෙනවා ද කිසි ම අඩුපාඩුවක් නැති දරුවෙක් ද කියන කිසි ම දෙයක් නො දැන ඒ මොහොතේ පටන් ම ඔවුන් අපට ආදරය කරන්න, සෙනෙහස දක්වන්න පටන් ගත්තා. එදා ඔවුන්ගේ සිත් විමසා බැලුවා නම්, රටක් රාජ්‍යයක් දිනුවා වගේ හැඟීමක් ඔවුන්ගේ සිත් තුළ දැක ගන්න ලැබේවි.

දුවේ පුතේ, මේක හරි පුදුම සහගත දෙයක්. ජීවිතයේ කවුරු නමුත් අප ප්‍රිය කරන්නේ අපේ ප්‍රියමනාප ස්වභාවයන් සලකා බලලා. ඇතැම්විට රූපය, ඒ වගේ ම කටහඬ, හැසිරීම, දක්ෂතා, ගතිගුණ... ඔය වගේ අප තුළ පවතින ස්වභාවයන්ට අනුව තමයි අපට සමාජයෙන් හිමි වන ඇල්ම, දයාව තීරණය වෙන්නේ. මුළුමහත් ලෝකයක් ම එසේ

ආදරය, සෙනෙහස දක්වන්නට යම් යම් නිර්ණායක තබා ගත්තා වුණත් අම්මා, තාත්තා එහෙම නැහැ. අනාගතයේ අපි කොහොම වෙයි ද කවුරු වෙයි ද මොන මොන ගතිගුණ දරයි ද කියන කිසි දෙයක් නිසැකයෙන් නො දැන, ඒ සියල්ල ඉතා යහපත් වේවා යන ප්‍රාර්ථනාව පෙරදැරි ව මහා සෙනෙහසකින්, මහා ආදරයකින් අපේ ජීවිත තෙත් කරන ළතෙත් බව අම්මාගෙන්, තාත්තාගෙන් හැර අන් කාගෙන් නම් ලබන්න ද?

## මේ තරම් ආදරයක්...!

අම්මා කෙනෙකුගේ, තාත්තා කෙනෙකුගේ හිතේ ගොඩනැගෙන දරුක ප්‍රේමය අපට කොහොමවත් ප්‍රමාණ කරන්න බැහැ. ඒ සෙනෙහසේ මහිමය ලොවට කියා පෑව තාත්තා කෙනෙක් හිටියා. ඒ තාත්තා අප දන්නා ඉතිහාසයේ ලෝකයේ ජීවත් වුණ පින්වන්ත ම තාත්තා. ඒ තාත්තගේ පුත්‍ර රත්නය තමයි තමන් තුළින් ම සත්‍යාවබෝධය උපදවාගෙන දෙව් මිනිස් ලෝකයාට සසර දුකෙන් නිදහස් වීම පිණිස මග හසර කියා දෙන සම්බුද්ධ රාජ්‍යය බිහි කොට වදාළේ. තාත්තා කෙනෙකු වීම ලෝකයේ සුලබ දෙයක්. හැබැයි, සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකගේ තාත්තා වීම ලෝකයේ පරම දුර්ලභ දෙයක්. අප ආදරයෙන් සරණ ගිය ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට තාත්තා වුණ සුද්ධෝදන රජතුමා සම්බුදුරජාණන් වහන්සේ අබිමුවේ දී ම යි මාපියවරුනගේ සිත රැඳි අපරිමිත දරු සෙනෙහස කොතරම් ද යන්න මේ ආකාරයෙන් කියා පෑවේ...

**"ස්වාමීනී, පුත්‍ර ප්‍රේමය වනාහි සිරුරෙහි සිවිය සිඳින්නේ ය. සිවිය සිඳ සම ද සිඳින්නේ ය. සම සිඳ මස ද සිඳින්නේ ය. මස සිඳ නහර ද සිඳින්නේ ය. නහර සිඳ ඇට ද සිඳින්නේ ය. ඇට ද සිඳ ඇටමිදුළුවල හැපී පැතිර පවතින්නේ ය.**

**ස්වාමීනී, දෙමව්පියන්ගේ අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරනු මැනැවී."**

දුවේ පුතේ, මහා ආදරයක තතු කියා පෑව ඒ පින්වන්ත තාත්තාගේ ඉල්ලීම සම්බුදුරජාණන් වහන්සේ පිළිගත්තා. අදටත්, සම්බුද්ධ ශාසනය තුළ මාපිය අවසරයකින් තොරව කුලදරුවන් පැවිදි කළ නො හැකි යි... සිවිය සම, මස්, නහර, ඇට සිඳ දමා ඇටමිදුළු තුළට කිමිද ගත් ඒ සා සෙනෙහසක් අම්මා, තාත්තා තුළ ම මිස අන් කවුරු තුළ නම් අප දකින්න ද...!

## බ්‍රහ්මයන් වසන නිවහන

සම්බුදුරජාණන් වහන්සේ දෙමව්පියන් හැඳින්වූ වචන කිහිපයක් තිබෙනවා. බ්‍රහ්මත්වයට පත්, බ්‍රහ්ම විහරණයෙන් යුතු උතුමන් ලෙසිනුයි අම්මාත්, තාත්තාත් සම්බුදුරජාණන් වහන්සේ විසින් පසසන ලද්දේ. මෛත්‍රිය, මුදිතාව, කරුණාව, උපේක්ෂාව යන උතුම් විහරණයන් තුළ නිබඳ වාසය කරනා බ්‍රහ්මයන් සේ අම්මා, තාත්තාත් තම දූ දරුවන් කෙරෙහි පතල මහා මෙත් සිතින්, සැපය කැමැති සිතින්, කරුණාබර සිතින්, මැදහත් සිතින් වාසය කරනවා.
ඒත්... අම්මා, තාත්තා දෙදෙනා සැරපරුෂ වන අවස්ථා ඔබ දැක ඇති. දොස් කියන, බැණ වදින අවස්ථා ඔබ දැක ඇති. අමනාපෙන් ඉන්න, නොහොඳ නෝක්කාඩු කියන අවස්ථාත් ඔබ දැක ඇති. මෛත්‍රී මූර්තියක් වූ අම්මා, තාත්තා කොහොමද එහෙම කරන්නේ? ඔබට, අපට නැගෙන මේ ප්‍රශ්නයට පුංචි කතාවකින් ම උත්තරයක් දෙන්න පුළුවනි.

දවසක්... සවස් යාමයේ කොලු ගැටයෙක් කැලෑවක් මැදින් ගමනක් යන්න සූදානම් වුණා. වගවලසුන් පිරි වනයේ සවස් කාලයේ ගමනේ යෙදීම අනතුරකට අත වැනීමක් බව දන්නා අම්මා ඒ ගමන යන්න එපා කියලා තරයේ කියා සිටියා. අම්මාගේ වචනය කනකට නො ගත් කොලුවා ගමන පිටත් වුණා.

**"කී දේ නාහා යන නුඹ කොටිය ම කාපිය..."**
අම්මා දෙස් දෙවොල් කිව්වා...

කැලයේ යම් දුරක් යද්දී සැබැවින් ම කොටියෙක් ගොරවාගෙන කොලුවා ඉදිරියට පැන්නා. එක් වර ම ඔහුට සිහිපත් වුණේ අම්මාගේ වචනය. හැබැයි කොලුවා දන්නවා අම්මා ඔහුට ආදරේ බව. ඒ නිසා ඔහු මෙහෙම සිතුවා.

**'මගේ අම්මා කටින් කිව්වේ යම් දෙයක් ද ඒ දේ සිදු වෙන්න එපා... මගේ අම්මා සිතින් සිතුවේ යම් දෙයක් ද එය ම සිදු වේවා!'**

කොටියා ගෙරවීම නැවතුවා. වලිගය හකුලා ගත්තා. හෙමින් ම හැරී ආපසු කැලය තුළට ගමන් කළා...

ඒ තමයි අම්මලාගේ හිත...! අම්මලාගේ විතරක් නෙමෙයි; තාත්තලාගේ හිතත් ඔය විදිහ ම යි... ඒ නිසා, කියන වචන කටුක වුණා කියලා අම්මා, තාත්තා එක්ක ගැටෙන්න එපා. දොස්තර කෙනෙක් සැර බෙහෙත් දෙන අවස්ථා තියෙනවා. ඒ විදිහට සැර බෙහෙතක් දෙන්නෙත් ලෙඩක් සනීප කරන්න නේ ද? එහෙම නැතිව 'රෝගියාට නරකක්, අයහපතක් වේවා' කියලා සිතුවිල්ලක් දොස්තරගේ හිතේ නැහැ. සැර බෙහෙත වුණත් දෙන්නේ රෝගීයා කෙරෙහි අනාදරයකින් නෙමෙයි. අම්මා, තාත්තා දෙන්නා ඒ දොස්තරගේ සිතුවිලිවලටත් වඩා බොහෝ උසස්, උතුම් තැනකයි සිටින්නේ. ඒ තැන මිනුමකින් දක්වන්න, ඉලක්කමකින් දක්වන්න අපට කවදාවත් පුළුවන් වෙන්නේ නැහැ. මිනුම්, ඉලක්කම්, නිර්ණායක සියල්ල ඉක්මවා යන අසහාය සෙනෙහසකිනුයි ඒ සිත් පිරී තියෙන්නේ.

## බුදුරජුන්ගෙන් සත්කාර ලද මාපියන්

අම්මාට, තාත්තාට ගරු සත්කාර දැක්වීම සම්බුදුරජාණන් වහන්සේගේ පැසසුමට ලක් වූවක්. සම්බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ විසින්මත් එ කරුණට පූර්වාදර්ශ සැපයූ බව

අපට දැකගන්නට පුළුවනි. ස්වකීය අතිජාත පුත්‍ර රත්නය වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සුදේශිත ධර්ම පර්යායන් මනා කොට ශ්‍රවණය කළ සුද්ධෝදන පිය රජතුමා අරහත් මුනිවරයෙකු බවට පත් වී පිරිනිවන් පා වදාළා. බෝසත් පුතු ඉපිද සත් දිනකින් කලුරිය කොට තව්තිසා දෙව්ලොව මාතෘ දිව්‍යරාජයා ව උපන් මහාමායා දේවිය දෙව්ලොව දී සම්බුදුරජුන්ගෙන් දහම් අසා දහම් ඇස උපදවාගෙන උපරිම භව හතකින් සසර දුක් නිමා කරන උත්තම භාවයට පත් වුණා.

සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නයත් ඒ අයුරින් ම මාපිය උපස්ථානයේ යෙදුණ අවස්ථා අපට ශාසනික ඉතිහාසයේ මුණගැහෙනවා. ගෞතම සම්බුද්ධ රාජ්‍යයේ ධර්ම සේනාධිපතීන් වහන්සේ, සම්බුදුරජුන්ගේ දකුණත් ශ්‍රාවකයාණන් වහන්සේ, ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ නැණවතාණන් වහන්සේ වූ සාරිපුත්ත මහරහතන් වහන්සේ පවා තමන් වහන්සේගේ පිරිනිවීමට පෙර අම්මා තිසරණයේ සමාදන් කරවා මහත් සේ උපකාර කොට වදාළා. දුවේ පුතේ, අපේ ශාස්තෘන් වහන්සේත්, ඒ මහානීය ශ්‍රාවකයාණන් වහන්සේලාත් ආදර්ශයෙන් ම පෙන්නුම් කොට වදාළේ දෙමව්පියන්ට සැලකීම කළ හැකි අග්‍රතම ආකාරය යි.

## ඒ ණය ගෙවන්නට....

යහපත් වචනයෙන්, ප්‍රණීත ආහාර පානාදියෙන්, නෑවීමෙන්, පිරිමැදීම් ආදියෙන්, දැක අසුනින් නැගිටීමෙන්, වැඳුම් පිදුම් කිරීමෙන්, ගෞරවාදර දැක්වීමෙන් දෙමව්පියන් විෂයෙහි සැලකිලි දැක්විය හැකි බව සැබෑවක්. හැබැයි දුවේ පුතේ, සම්බුදුරජාණන් වහන්සේ වදාළේ අම්මා තාත්තා දෙදෙනා උර දෙකෙහි තබාගෙන යම් දරුවෙක් අවුරුදු සියයක් මුළුල්ලේ නාවමින්, කවමින්, පොවමින්, උපස්ථාන කරමින්, පෝෂණය කරමින් සත්කාර කෙරුවා වුණත් මව්පියන්ට ඇති ණය ගෙවී යන්නේ නැහැ කියලා. ඒ සා මහත් උපකාරයකුයි අම්මා, තාත්තා අප සුගතියේ උපතකට ගෙන ඒමෙන් සිදු කර තිබෙන්නේ. දුවේ, පුතේ, අම්මාට තාත්තාට ඇති ණය ගෙවා දමන්නට නම්

දරුවෙකු විසින් කළ යුත්තේ දෙමව්පියන් ව තිසරණයේ පිහිටවීම, සීලයේ සමාදන් කරවීම, සේඛ බල දියුණු කරන්නට ඇප උපකාර කිරීම. දුව පුතාටත් සම්බුදුරජාණන් වහන්සේගේ නිර්මල ධර්මය අසන්නට, ඒ ධර්මයේ හැසිරෙන්නට වාසනාව උරුම වී තිබෙන නිසා අම්මාට, තාත්තාට ඒ සැබෑ ම උපස්ථානයේ යෙදෙන්න අද අවස්ථාව තිබෙනවා. ඔබට ඒ උතුම් අවස්ථාවෙන් සැබෑ ඵල ප්‍රයෝජන ලබන්නට වාසනාව ලැබේවා! කියා අපත් ප්‍රාර්ථනා කරනවා.

දුවේ පුතේ, අම්මා හෝ තාත්තා හෝ අප මරා දැමුවා වුණත් ඒ නිසා අම්මා හෝ තාත්තා ඒකාන්තයෙන් ම නිරයේ වැටෙන බවක් කිව නො හැකි යි. හැබැයි යම් දරුවෙකු අතින් අම්මාගේ හෝ තාත්තාගේ ජීවිතය හානි වුණොත් ඒ දරුවා මරණයෙන් පස්සේ ඒකාන්තයෙන් ම කල්පයක් නිරයේ ම යි. ඒ තමයි අපගේ ශාස්තෘන් වහන්සේගේ අවබෝධය. දුවේ පුතේ, අම්මා තාත්තා අප මරා දැමුවා වුණත් ඒ දෙදෙනාට බරපතළ කර්ම විපාක සකස් වන්නේ නැහැ. නමුත්, අපි අම්මාට තාත්තාට රවා බැලුවත් එයින් අපට මහා අයහපතක්, මහා විනාශයක් තමයි සිද්ධ වෙන්නේ. ඒ නිසා, ‘සිතන සිතුවිල්ලකින්වත් අපි නම් අම්මා තාත්තා කෙරෙහි වැරදි ආකාරයකින් නොපිළිපන් දරුවන් වන්නෙමු.’ කියා යි අපි හික්මෙන්න ඕනේ.

මේ දක්වා ජීවිතයේ කයින් හරි, වචනයෙන් හරි, සිතින් හරි අම්මා තාත්තා කෙරෙහි වරදක් වී තිබෙනවා නම් අද ම අම්මා, තාත්තාට දණ ගසා වන්දනා කරලා වරද වෙනුවෙන් සමාව ඉල්ලන්න. අම්මා, තාත්තා ජීවතුන් අතර නැති නම් කල්‍යාණමිත්‍රයාණන් වහන්සේ නමක්, සෑ රජාණන් වහන්සේ නමක්, බෝරජාණන් වහන්සේ නමක් හමුවේ විවෘත වී වරදට සමාව ඉල්ලා ගන්න. අදින් පස්සේ මේ ජීවිතයේ කිසිම දවසක අම්මා, තාත්තා කෙරෙහි වරදක් නොවන විදිහට පරිස්සම් වෙන්න.

## වඳිමු පා යුග නිතින්...!

දුවේ පුතේ, අටවක සහ අමාවක පොහොය දිනවල සෙන්පති දෙවිවරුනුත්, පසළොස්වක පොහොය දිනවල සතරවරම් දෙවිවරුනුත් මේ මිනිස් ලෝකය සිසාරා ගමන් කරන බව අංගුත්තර නිකාය පළමු පොත් වහන්සේගේ අන්තර්ගත 'චතුමහාරාජ' සූත්‍රයේ දැක්වෙනවා. ඒ දේව සේනාවන් විසින් පළමුවෙන් සොයා බලන්නේ 'මේ ලෝකයේ බොහෝ මිනිසුන් මවට සලකනවා ද?', 'මේ ලෝකයේ බොහෝ මිනිසුන් පියාට සලකනවා ද?' යන්න යි. දෙමව්පියන්ට සත්කාර කරන තැනැත්තා දෙව්මිනිස් ලෝකයේ ගරු බුහුමනට පත් වනවා, ප්‍රශංසාවට ලක් වනවා, බොහෝ පින් රැස්කර ගන්නා කෙනෙක් වෙනවා. ඒ විතරක් නෙමෙයි, යම් දරුවෙක් දෙමව්පියන්ට සලකනවා නම් ඒ කෙනා තමයි දුවේ පුතේ ධර්මය දියුණු කරන්නේත්. අම්මාට නොසලකා, තාත්තාට නොසලකා ධර්මය දියුණු කරනවා කියන කාරණය ලෝකයේ සිද්ධ වෙන්නේ නැහැ. මේ ධර්මය සත්පුරුෂ ධර්මයක්. ඒ සත්පුරුෂ ධර්මය වැඩෙන්නේ සත්පුරුෂයන් තුළ. සත්පුරුෂ ගුණ තිබෙන කෙනා තමයි අම්මාට සලකන්නේ, තාත්තාට සලකන්නේ.

මේ ජීවිතයේ ඔබට අතිශයින් ම උපකාරක වුණ ආදරණීය අම්මාටත්, තාත්තාටත් මැනැවින් පුද සත්කාර කරන සත්පුරුෂ දරුවන් බවට පත් වෙමින් සත්පුරුෂයන්ගේ ම උරුමය වූ ගෞතම සම්බුද්ධ ශාසනය තුළ ඒ පරමෝත්තම දහම් පිළිවෙත දියුණු කරන්නට පින්වත් ඔබට උතුම් තෙරුවනේ ආශීර්වාදය හිමි වේවා!!!

අප සුගතියේ ඉපදවූ ආදරණීය අම්මාගේත්, ආදරණීය තාත්තාගේත් පා යුග අපිදු නිති සිරසින් වන්දනා කරමු.

**"දසමාසේ උරේකත්වා**
**පෝසේසි වුද්ධිකාරණං**
**ආයු දීඝං වස්ස සතං**
**මාතුපාදං නමාමහං"**

"යම් අම්මා කෙනෙක් දස මසක් උසුලා හිඳ, මතු අභිවෘද්ධිය පිණිස, සිය වසක දීර්ඝායුෂ පිණිස මා පෝෂණය කරනු ලැබුවා ද ඒ අම්මාගේ පාද මම වන්දනා කරමි."

**"වුද්ධිකාරෝ ආලිංගිත්වා**
**චුම්බිත්වා පියපුත්තකං**
**රාජමඣ්ජං සුපතිට්ඨං**
**පීතු පාදං නමාමහං"**

"අපගේ තාත්තා ප්‍රිය පුත්‍ර (දුහිතෘ) වූ මා වැළඳගෙන, සිප සනසා, ආහාර පානාදිය ලබා දීමෙන් පෝෂණය කළේ ද රාජරාජ මහාමාත්‍යාදීන් අතර ප්‍රකට කළේ ද ඒ තාත්තාගේ පා කමල් මම වන්දනා කරමි."
සාදු! සාදු!! සාදු!!!

මව්පියන්ට සැලකීම මංගල කාරණයකි’ යි බුදුරජාණන් වහන්සේ මහා මංගල සූත්‍රයෙහි දී වදාළ සේක. මෙසේ සිය දෙමාපියන් කෙරෙහි දයා කරුණාවෙන් සලකන දරුවන් බුදුරජාණන් වහන්සේ විසින් ම වර්ණනා කර ඇති අයුරු ඉතිවුත්තක පාළියේ සඳහන් වේ.

“භාග්‍යවතුන් වහන්සේ විසින් ම යි මේ කාරණය වදාළේ අරහත් මුනිඳුණන් ම යි මෙය වදාළේ. මේ විදිහටයි මට අසන්නට ලැබුණේ.

**පින්වත් මහණෙනි, සමහර දරුවන් ඉන්නවා, තමන්ගේ ගෙදර ඉන්න මව්පියන්ට හොඳින් පුදනවා ඉතින් අන්න ඒ වගේ දෙවල් තමයි බ්‍රහ්මයා සහිත තැන් වෙන්නේ. පින්වත් මහණෙනි, සමහර දරුවෝ අන්න ඒ වගේ දේවල් තමයි පූර්ව ආචාර්යවරු සහිත තැන් වෙන්නේ. පින්වත් මහණෙනි, සමහර දරුවෝ ඉන්නවා තමන්ගේ නිවෙස්වල ඉන්න දෙමාපියන්ට හොඳට පුදනවා. ඉතින් අන්න ඒ වගේ තැන්වල තමයි නොයෙක් පිදුම් ලබන්න සුදුසු අය ඉන්න තැන් වෙන්නේ.**

පින්වත් මහණෙනි ‘**බ්‍රහ්ම**’ කියලා කියන්නේ.
මේ මව්පියන්ට කියන තවත් නමක්!
පින්වත් මහණෙනි ‘**පූර්ව දේවතාවන්**’ කියල කියන්නේ
මේ මව්පියන්ට කියනා තවත් නමක්!
පින්වත් මහණෙනි ‘**පූර්ව ආචාර්ය**’ කියල කියන්නේ
මේ මව්පියන්ට කියනා තවත් නමක්!
පින්වත් මහණෙනි ‘**ආහුණෙය්‍ය**’ (පිදුම් ලබන්න සුදුසු) කියන්නේ’
මේ මව්පියන්ට කියනා තවත් නමක්
ඒකට හේතුව කුමක්ද?

**පින්වත් මහණෙනි, මේ මව්පියවරු තමයි දරුවන්ට ගොඩාක් උපකාර කරන්නේ. රැකබලාගන්නේ අතපය වඩලා පෝෂණය කරන්නේ මේ ලෝකය පෙන්වලා දෙන්නේ”**
මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

එය මේ අයුරින් ද පවසන්න පුළුවනි.

මව්පියන් තමයි **'බ්‍රහ්ම'** කියන්නේත්, **'පූර්ව ආර්ය'** කියන්නේත් දරු පරපුරට අනුකම්පා කරන ඒ මව්පියෝ දරුවන්ගේ පුදපූජාවන් ලැබීමටත් සුදුසු යි.

ඒ නිසා ඥාණවන්ත කෙනා ඒ මව්පියන්ට නමස්කාර කරනවා. සත්කාර කරනවා. අහාරපාන දෙනවා. වස්ත්‍ර සපයා දෙනවා. නාවා පිරිසිදු කරනවා. පා ද්වෙනය කරනවා. මේ විදිහට සත්කාර කරනවා.

ඒ විදිහට මව්පියන්ට උපස්ථාන කරන ඥාණවන්ත කෙනා මේ ජීවිතයේදීත් ගොඩාක් ප්‍රශංසා ලබනවා. මරණින් මත්තේ දෙව්ලොව ගිහිල්ලා සතුටු වෙනවා.

(සබ්‍රම්මක සූත්‍රය - ඉතිවුත්තක පාළි)

## දෙමාපියන් පිණ්ඩපාතයෙන් පෝෂණය කළ භික්ෂුවක් !

පෙර බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ භික්ෂූන් වහන්සේ නමකගේ දෙමාපියන් මහලු ව ජරාජීරණ වී ගිය කල්හී, සිය දෙමාපියන්ට සැලකීමෙහිලා අන් මගක් නොදැන, ඒ භික්ෂූන් වහන්සේ සිය පාත්‍රයට ලැබෙන පිණ්ඩපාතයෙන් තමාත් යැපෙමින් සිය මහලු දෙමාපියන් ද පෝෂණ කළ සේක.

## බුදුරදුන්ටත් ඒ කරුණ සැලවෙයි…

මෙය බුදුරජාණන්ට සැලව ගිය කල්හී ඒ භික්ෂූන් වහන්සේ කැඳවා කරුණු සැබෑදැ'යි විමසා,
'සාදු!සාදු! භික්ෂුව, පෙර තිරිසන්ගත සත්වයෝ පවා සිය දෙමාපියන්ට සැලකීමෙහි නියුතු වූවෝ යැයි පවසා සිය මහලු ගිරා-දෙමාපියන්

පෝෂණය කළ ගිරා පෝතකයෙකුගේ කථා වස්තුව දනවමින් සාලිකේදර ජාතකය ගෙන හැර පෑහ.

(සාලිකේදර ජාතකය බලන්න)

## කාශ්‍යප බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායක...

එහෙයින් මව්පියන් සැලකීම බුද්ධාදී සත්පුරුෂයන් විසින් ද ප්‍රවර්ණිතය. කාශ්‍යප බුදුරජුන්ගේ අග්‍ර ගිහි උපස්ථායකයාණන් වූ ඝටීකාර නම් උත්තමයාණෝ ද සිය අන්ධ දෙමාපියන් පෝෂණය කරමින් ඉතා දුෂ්කර ගිහි ජීවිතයක් ගත කළ සේක. ඔහු ද ඒ කාශ්‍යප බුදු සමිඳුණන් විසින් බෙහෙවින් ම වර්ණනා කළ සේක.

(ඝටීකාර සූත්‍රය-මජ්ඣිම නිකාය බලන්න)

## සක්දෙවියන් පවා මිනිස් කල...

තවද සක්දෙව් මහරජතුමා ද තමන් ඒ සක්දෙව් පදවිය ලැබීම පිණිස හේතු-භූත වූ පෙර මිනිස් ජීවිතයක් ගත කරන කල් හි සමාදන් වී ආරක්‍ෂා කළ ව්‍රත 7 ගැන සඳහන් කරද්දී එහිද දෙමාපියන්ට සැලකීම ඇතුළත් විය. මෙසේ දෙව්ලොව උපත පිණිස ද, දෙව්ලොවට අධිපති බව ලැබීම පිණිස ද මාපිය උපස්ථානය උපස්ථම්භක විය.

## අගසව් හිමියන් කළගුණ සලකයි...

තවද අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහරහතන් වහන්සේ පවා මව්පිය උපස්ථානයෙහි අගය ආදර්ශයෙන් ම පෙන්නුම් කළ සේක. වරෙක දුකට පත් එක්තරා ප්‍රේතියක් හමුවී ඇය මීට භවයන් 5 කට පෙර සිය මව් වී හුන් වග දැන ඈ කෙරෙහි අනුකම්පාවෙන්, තමන් වහන්සේ පිණ්ඩපාතයෙහි හැසිර ලද බොජුනෙන් සංඝයා වහන්සේ කිහිප නමක් පුදා ඒ පින් ඥාති ප්‍රේතිය කෙරෙහි අනුකම්පාවෙන් අනුමෝදන් කොට

ඈ සුවපත් කළ සේක. තව ද සංඝයා උදෙසා කැප වූ චීවරයක් ද, කුටියක් ද සකසා පූජා කොට ඈ වෙත ඒ පින් ද අනුමෝදන් කොට තවත් සෙත සැලසූ සේක.

## මැරෙන්න මොහොතකට පෙර...

තවද, සිය ජීවිතයේ අවසාන නිමේෂයේ, වැදූ මව් වූ සාරී බ්‍රාහ්මණතුමිය වෙත ගොස්, අගේ දුර්ලබ්ධිය අතැරවා තිසරණ සහිත පංච ශීලයෙහි පිහිටුවා වදාළ සේක.

## අමා මෑණි බුදුහිමියන් පවා...

ඒ මතු ද නොව, බුදු සමිඳාණන් පවා තාවතිංසයට වැඩමවා පඬුපුල් අසුනේ හිඳ මාතෘ දිව්‍යරාජයාණන් ප්‍රමුඛ දෙව් පිරිසට වස් සාරමාසය පුරාවට ම අභිධර්මය දේශනා කොට මාතෘදිව්‍යරාජයාණන් සෝතාපත්ති ඵලයෙහි පිහිටුවාලූ සේක. තවද බුද්ධත්වයෙන් වසරක් ගත වූ තැන විසි දහසක් වූ භික්ෂු සංඝයා පිරිවරාගෙන රෝහිණී නදියෙන් එතෙරව සිය පියරජතුමාණන් බැහැදැක ඔහුගේ වැඳුම් පිළිගෙන අමා සදහම් වැසි වස්සවමින් සුදෙවුන් රජුන් ද ඉපදෙන මියෙන සසරින් සදහට ම එතෙර කොට වදාළ සේක.

## අවාසනාවත්ත අජාසත්තලා...

මෙසේ සිය දෙමාපියන්ට සලකා වදාළ සාදු චරිතයන්හි නම් නිමක් නැත්තේම ය. එසෙයින් ම, අවාසනාවත් පාපමිත්‍ර සේවනයත් නිසාවෙන් නිවන් පුර දොර වසාගෙන අවාපුරයෙහි වැදී අද දුක් විඳිනා පීතෘ ඝාතක අජාසත්තයන් ගැන ද සිහි කළ යුත්තේ ම ය. එහෙයින් සැප කැමති සත්වයෝ සිය දෙමාපියන් වධයෙහි තැවීමෙහි නොයෙදෙත්වා!

## දිරන මව්පියෝ වසති දුකසේ...

තවද අප බුදුරජාණන් වහන්සේ පරාභව සූත්‍රය, වසල සූත්‍රය ආදී බොහෝ සූත්‍රයන් හී ද දක්වා වදාළේ හැකියාව තිබිය දී දෙමාපියන් නොසලකා හැරීම පිරිහෙන වසල කරුණක් ලෙස ය.

"යෝ මාතරංවා පිතරං වා
ජිණ්ණකං ගත යොබ්බනං
පහුසන්තෝ න භරතී
තං ජඤ්ඤා වසලෝ ඉති"

(වසල සූත්‍රය-සුත්ත නිපාතය)

"හොඳට කාබී වසන සුවසේ
දරුවෝ පමණක් සිටිති සුවසේ
දිරන මව්පියෝ වසති දුකසේ
මොවුන් වසලය දනුව මෙලෙසේ"

## මව්පියෝ දරුවන් පතන්නේ...

බොහෝ දෙමාපියන් දරුවන් හදනුයේ, වඩනුයේ අපේක්ෂා සහගතව ම ය. බුදුරජුන් මෙය වදාළ සේක.

1. අප විසින් පෝෂණය කරනු ලබන මොහු අප ද පෝෂණය කරන්නේ ය.
2. අපගේ කටයුතු ද කරන්නේ ය.
3. අපගේ කුල පරම්පරාව ද බොහෝ කල් පවත්වන්නේ ය.
4. දායාදය මැනැවින් පරිහරණය කරන්නේ ය.
5. එමෙන් ම මියගොස් පරලොව ගියවුන් උදෙසා පින් පිණිස දනාදී පින්කම් කරන්නේ ය.

'පින්වත් මහණෙනි, කාරණා 05 ක් දකිමින් නුවණැතියන් විසින් දරුවන් පතයි.

## ඉටු කළ යුතු යුතුකම්...

එසේ ඇති දැඩි වන දරුවන් විසින් දෙමාපියන්ට ද, දෙමාපියන් විසින් දරුවන්ට ද ඉටු කළ යුතු යුතුකම් පිළබඳව බුදුරජාණන් වහන්සේ දීඝනිකායේ සිඟාලෝවාද සූත්‍රයෙහි ලා වදාළ සේක.

පුත්‍රයෙකු විසින් පූර්ව දිශාව වූ මව්පියෝ පස් කරුණකින් උපස්ථාන කළ යුත්තාහු ය. මව්පියන් විසින් හැදූ වැඩූ මම මහලු වූ කල ඔවුන් රැකබලා ගන්නෙම් යි. මව්පියන්ට කළ යුතු දෙයක් ඇති කල්හී කර දෙන්නනෙම් යි. මව්පියන්ගේ කුල පරපුර ඒ අයුරින් පවත්වා ගන්නෙම් යි. මව්පියන්ගෙන් ලද දායාදය නිසි අයුරින් පරිහරණය කරන්නෙම් යි. එමෙන් ම මව්පියන් මියගිය පසු දන්පැන් පුද ඔවුන්ට පින්පෙත් දෙන්නෙම් යි.

පුත්‍රයෙකු විසින් පූර්ව දිශාව වූ මව්පියෝ මේ පස් කරුණෙන් උවැටන් කරනු ලබන්නාහු පස් කරුණකින් සිය පුත්‍රයාට ඔවුහු අනුකම්පා කරති. පවින් වළක්වති. පිනෙහි යොදවති. ශිල්ප ශාස්ත්‍රාදියෙහි පුහුණු කරවති. ගැළපෙන ස්ත්‍රියක හා සම්බන්ධ කරවති. සුදුසු අවස්ථාවෙහි දායාදය පවරති. පුත්‍රයා විසින් පූර්ව දිශාව වූ මව්පියෝ මේ පස් කරුණින් උවටැන් කරන ලද්දාහු යථෝක්ත පස් කරුණෙන් සිය පුතුට අනුකම්පා කරති.

එහෙයින් ම අනල්පව අප කෙරෙහි උපකාරවත් වූ අප දෙමාපියන් කෙරෙහි පෙරලා උපකාර කරමින් මෙලොව, පරලොව සැප සම්පත් උදාකර ගැනීමටත් එතුළින් ම අමා නිවන් මග විවර කර ගැනීමටත්

# පුණ්‍යක්‍රියා

(නිවැරදි පින්කමකට අත්වැලක්)

## පැළ සිටුවීම

ගස්වැල් කියන්නේ මහ පොළවේ ජීවනාලිය වගේ දෙයක්. පිරිසිදු ජලය, වාතය, ආහාර ලැබෙන්නේ ගස්වැල් නිසා බව අපි කවුරුත් දන්නවා. මිනිස් අපිට වගේම සතා සිව්පාවුන්ටත් ජීවත් වෙන්න පුළුවන්කම ලැබිලා තියෙන්නේ මේ ගස්වැල් නිසයි.

අද වගේ නෙවේ. එදා අපේ මුතුන්මිත්තෝ පරිසරයත් එක්ක ජීවත් වුණේ ගහට පොත්ත වගේ බැඳීමකින්. පරිසරය පූජනීය වස්තුවක් විදිහටයි ඔවුන් සැලකුවේ. ගස්වැල්වලට පවා වැන්දා. ජලය උතුම් වස්තුවක් විදිහට රැක ගත්තා. සතාසිවුපාවට ආදරේ කළා. ගහක් කොළක් කැපුවත් ඒක පරිසරයට දැනුනෙවත් නැහැ. ඒත් මිනිසාගේ දියුණුව කියලා කියන මේ පිරිහීම පටන් ගත්ත දවසේ ඉඳලා පරිසරය කියන්නේ තමන්ගේ අම්මා කියන කාරණය ඒ අය අමතක කළා. ඒ පිරිසිදු ලස්සන පරිසරය විනාශ කරන්න පටන් ගත්තා. ඒ මහා පාපකර්මයේ විපාක අද වෙන කොට මිනිස්සුන්ට ලැබෙන්න පටන් අරගෙනයි තියෙන්නේ. ඒත් තාම මිනිස්සුන්ට ඒක හරියට දැනිලා නැහැ. හැබැයි දැනෙන දවසට මේ මහපොළවේ එක ගහක්වත් ඉතිරි වෙයිද දන්නෙත් නැහැ.

රතු ඉන්දියානු ජාතිකයන් තමන්ගේ සියලුම ඉඩම් සුදු ජාතිකයන්ට විකුණා දැමිය යුතුයි කියලා ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නගරයේ ආණ්ඩුකාරයා නිකුත් කරපු නිවේදනයට රතු ඉන්දියානු නායක සියැටල් ඒ කාලේ ඇමරිකානු ජනාධිපති ෆ්‍රැන්ක්ලින් පියර්ස්ට යවපු දීර්ඝ ලිපියේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

**"මේ මහපොළොව මිනිසාට අයිති නැති බව අපි දනිමු. මිනිසා අයිති වන්නේ මහපොළොවට යි. ඥාතීන් සියලු දෙනා එකම ලේ බැම්මකින් බැඳෙන්නාක් මෙන් මෙලොව ඇති සියලූ දෑ ද එකිනෙකට බැඳී පවතී. ජීවන ජාලය වියන ලද්දේ මිනිසා විසින් නොවේ. ඔහු හුදෙක් එහි එක් වරපටක් පමණකි. ඔහු මෙම ජීවන ජාලයට යම් බලපෑමක් කරයි ද, හෙතෙම එය තමන්ට ම සිදුකර ගත්තා වේ."**

ඒ ගස්වැල්වල වටිනාකම අපිට මුලින් ම කියලා දුන්නේ අපගේ භාග්‍යවතුන් වහන්සේයි. උන්වහන්සේගේ උපත සිදු වුණේ ලුම්බිණි සල් උයනෙ දි. උන්වහන්සේ සම්බුදු බවට පත්වුණේ ගයාවේ නේරංජරා ගඟ අසල ඇසතු බෝ සෙවණේ දි. පළමු ධර්ම දේශනාව කළේ බරණැස ඉසිපතනයේ මිගදායේ (මුවන්ගේ අභයභූමියේ) දී. පිරිනිවන් පා වදාළේ කුසිනාරාවේ උපවත්තන කියන සල් වනයේ දි. වගේම උන්වහන්සේගේ ජීවිතයේ තවත් බොහෝමයක් වැදගත් සිදුවීම් මේ පරිසරයත් එක්ක ගස්වැල් සතාසිවුපාවුන් එක්ක සම්බන්ධයි. ගස්වැල් සිටුවීම නිති වැඩෙන පින්කමක් හැටියටයි භාග්‍යවතුන් වහන්සේ සංයුක්ත නිකායේ පළමුවැනි පොත්වහන්සේ තුළ එන වනරෝප සූත්‍රයේ දී පෙන්වා වදාළේ.

**"යම් කෙනෙක් මල්පල උයන් වවන්නේ ද පියවි වන වගා කොට දෙන්නේ ද ඒදඬු පාලම් කරවන්නේ ද යම් කෙනෙක් පැන්හලුත් පැන් පොකුණුත් ආවාසත් කරවත් ද, ඔවුනට හැමකල්හී දහවලුත් රෑත් පින් වැඩේ. ධර්මයේ පිහිටි ශීල සම්පන්න වූ ඒ ජනයෝ ස්වර්ගයට යති."**

(වනරෝප සූත්‍රය - සංයුක්ත නිකාය 1 - දේවතාසංයුත්තය)

අද අපි කොන්ක්‍රීට් වනාන්තරවලට කොටු වෙලා අන්තර්ජාලයත් එක්ක ජීවත් වුණාට අතීතයේ මිනිස්සු ජීවත් වුණේ ගස්කොළන් එක්ක යි. සොබාදහමත් එක්ක යි. ඒ නිසා ඒ මිනිස්සුන්ගේ ඇඟපත හයියට තිබුණා. ඒ වගේම හිතත් හරි ලස්සනට තිබුණා. ඒ අය වින්දේ සොබාදහමේ තියෙන සොබාවික සුන්දරත්වය. නමුත් අද අපි සොබාදහමින් ලබන්නේ කෘත්‍රිම වින්දනයක් විතරයි.

බුදුදහමින් අපට කියා දෙන ජීවන ප්‍රතිපදාව හරි සරල එකක්. බුදුරජාණන් වහන්සේගේ ජීවිතේ ගත්තත් ශ්‍රාවකයන් වහන්සේලාගේ ජීවිත ගත්තත් උන්වහන්සේලා ගස්මුල්, වන සෙනසුන් ඇසුරු කරගත්ත හරි සරල ජීවිත ගත කළේ. මේ බලන්න, උන්වහන්සේලා ඒ පරිසරයත් එක් මොන තරම් සැහැල්ලුවෙන් ප්‍රීතියෙන් වැඩ සිටිය ද කියලා. මේ තාලපුට මහරහතන් වහන්සේ කියපු ගාථාවක්.

**"වැස්ස කාලෙට තණකොළ වැවෙනවා අඟල් හතරක් විතර උසට. මහ වනයේ මල් පිපෙන්න ගන්නවා හරියට වලාකුළු වගේ. එතකොට මං ඒ කඳු අතරේ බිම තමයි නිදා ගන්නේ. ඒ නිල් තණබිම අලුත් යහනාවක් වගෙයි. හරිම මෘදුයි.**

**"ඒයි සිත! මේ සුන්දර වනාන්තරයේ වැහි වලාකුළුවලින් ලස්සන වුණු කඳු වළල්ලේ නිදහසේ ඇවිදගෙන යන මුවෙක් වගේ, මමත් දැන් කරදරයක් නැති සිතින් මේ කඳු වළල්ලට වෙලා ඉන්නවා. ඒයි සිත! නුඹ පැරදුණ බවට මට කිසිම සැකයක් නැහැ."**

තාලපුට මහරහත් තෙරිඳුන් වදාළ ගාථා
ථේරගාථා පාලිය - ඛුද්දක නිකාය

අද අපි යම් ප්‍රයෝජනයක් ගස්වැල්වලින් ලබනවා නම් ඒ අපේ මුතුන් මිත්තෝ ගස්වැල් හදපු නිසයි. අපිත් අද ගසක් හිටෙව්වොත් ඒක අනාගතය වෙනුවෙන් අපි කරන පරම යුතුකමක් වෙනවා. අන්න ඒ නිසා නිවැරදි පින්කමකට අත්වැලක් සපයන පුණ්‍යක්‍රියාවකින් අද අපි ඔබට කියා දෙන්නේ මුළු ජීවිත කාලය පුරාම ඔබට පින් රැස්වෙන , මිනිස් අපිටත් මුළු මහත් පරිසරයටත් දවසක මහා වෘක්ෂයක් වෙලා වාසනාව ළඟා කරදෙන, පැළයක් රෝපණය කරගන්නා ආකාරය ගැනයි.

මුලින් ම අපි සිටුවගන්න සුදුසු පැළයක් තෝරා ගන්නට ඕන. ලෙඩරෝග නැති, වැඩීම බාල නැති දවසක ඉතා වටිනා ප්‍රයෝජන ලැබෙන ගසක් නම් වඩාත් හොඳයි.
මේ සඳහා කොස්, අඹ, බෙලි, සුදු සඳුන් වගේ විවිධ වටිනාකම් ඇති

පැළයක් හෝ වර්ග කීපයක් ඔබට තෝරා ගන්න පුළුවන්.

පැළයක් සිටුවා ගන්න අවශ්‍ය කරන උපකරණ සහ පොහොර කලින්ම එකතු කර ගෙන සිටීම ඔබට පහසුවක් වේවි. මේ සඳහා කාබනික පොහොර ම පාවිච්චි කළොත් දවසක වසවිස නැති එළදාවක් ලබාගන්න අපි හැමෝටම පුළුවන්.



පැළය සිටුවීම සඳහා සුදුසු බිමක් තෝරාගෙන වළක් කපා ගන්න ඕන. මේ වළ දිග, පළල, උස අඩිය බැගින් තිබෙන විදිහට කපා ගැනීම ප්‍රමාණවත්. ඔබ සිටුවන්නට යන්නේ පැකට්ටුවක දමා රෝපණය කරගත් පැළයක් නම් ඉතා පරිස්සමෙන්, මුල්වලට හෝ අරටුවට හානි නොවෙන විදිහට ඉටි කවරයෙන් ඉවත් කර ගන්න.

පැළය සිටුවාගන්න කලින් වළ තුළට කොම්පෝස්ට් පස් මිශ්‍ර මතුපිට පස් ස්වල්පයක් දමා ගන්න. ඉන් මුදුන් මුල අල්ලාගැනීම පහසු කරාවි. ඉන්පසු පැළය වළ තුළ තබා පස්වලින් වසන්න. කඩින්කඩ කොම්පෝස්ට් පොහොර එකතු කරන්නත් ඔබට පුළුවන්.



පැළය සිටුවාගැනීමෙන් පසුව පස් හෑරෙන්නේ නැති විදිහට වතුර වත් කර ගන්න ඕන. සිටුවාගත් පැළයට අවශ්‍ය වෙලාවට ජලය සහ පොහොර යොදන්නත් වල්පැළ ගලවලා කෘමි සත්තු, දිලීර රෝග වගේ පැළයට එන හානි අවම කරන්නත් මතක තියාගන්න.

පින්වත් ඔබ අද මේ රෝපණය කරන පැළය දවසක මහා වෘක්ෂයක් වෙලා බොහෝ මිනිස්සුන්ගෙත් සත්තුන්ගෙත් කුසගිනි නිවාවි.

වෙහෙසට පත් අයට සෙවණ සලසාවි. කුරුල්ලන්ට නිවසක් වේවි. ඒ විදිහට කවුරු හරි මේ ගහෙන් ප්‍රයෝජනයක් ගන්න හැම වෙලාවකම මේ ගහ හිටවපු ඔබට පින් රැස් වෙනවා. ඒ නිසයි ගසක් සිටුවීමෙන් නිති පින් වැඩෙනවා කියන්නේ.



දැන් ඔබ, බොහෝ දෙනෙකුට ප්‍රයෝජන ලබා දෙන වටිනා පැළයක් රෝපණය කරගෙන නිති වැඩෙන පින්කමක් මනාව සිදුකරගත් පින්වන්ත ශ්‍රාවකයෙක්. අපට මරණ මංචකයේ දී ඉතිරිවන්නේ කළ හොඳ නරක දෙක විතරයි. ඒ නිසා ජීවත්ව ඉන්න මේ කෙටි කාලෙදී යහපත් හොඳ දේවල්ම විතරක් ලෝකයට දායාද කිරීම අපේ යුතුකමක් බව සිහිතබා ගන්නට ඕනෑ. ඔබට පිනෙන් පිරි දිවියක් ලැබේවා!

තෙරුවන් සරණයි!

## 2016 වර්ෂයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විශිෂ්ට සාමර්ථ්‍යය ලබා ගත් ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ ප්‍රතිඵල

| නම | ශිෂ්‍යත්ව අංකය | ප්‍රතිඵල |
|---|---|---|
| සචිත්‍ර උදාර ඩයස් | 184 | A9 B1 |
| දෙව්මි වසුන්දරා | 24 | A9 |
| ජනනි අශින්කා | 345 | A9 |
| ප්‍රබෝධා යසන්ත්‍රි | 45 | A7 B2 |
| නෙත්මි සහසිරි | 13 | A7 B2 |
| චේතනා සෙව්වන්දි | 66 | A7 B2 |
| තනුජා දිල්රුක්ෂි | 139 | A7 B1 C1 |
| ප්‍රශාදි නිමේෂිකා චිරන්දි | 119 | A7 B1 S1 |
| තරංගා සෙව්වන්දි කෞෂල්‍යා | 65 | A5 B3 |

"යෝ මාතරං වා පිතරං වා මච්චෝ ධම්මේන පෝසති
තායනං පාරිචරියායං මාතා පිතූ සු පණ්ඩිතා
ඉධේ ච නං පසංසනති පෙච්ච සග්ගෙ පමෝදතී'ති"
(මාතුපෝසක සූත්‍රය - බ්‍රාහ්මණ සංයුක්තය)

යමෙක් සිය මව්පියන් දැහැමිව පෝෂණය කරත්ද, මව්පියන්ට සේවය කිරීම හේතුවෙන් ඔහුව නුවණැත්තෝ මෙලොවදී ම පසසත්. පරලොව ද ඔහු සුගතියෙහි සතුටුවෙයි.

© 2017 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P : 0112 571 471 Fax : 0112 548 400 Web : www.shraddha.lk Email : edu@shraddha.lk
www.facebook.com/ShraddhaTV www.youtube.com/ShraddhaTV www.google.com/+ShraddhaTV www.twitter.com/ShraddhaTV